සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 07 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2023(2024) | 32 S I,II |
|---|---|---|

විභාග අංකය : ........................................ **ගණිතය** කාලය පැය දෙකයි

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. පහත දී ඇති ත්‍රිකෝණවල කෝණ අනුව ත්‍රිකෝණ වර්ගය ලියා දක්වන්න.




a.. ............................




b. ............................

02. A = { 12 හි සාධක } නම්, A කුලකය අවයව සහිතව ලියන්න.

03. පහත දී ඇති වර්ෂ අතරින් අධික වර්ෂය තෝරා එය වටා රවුමක් අඳින්න.

1943, 1800, 2010, 2112

04. සුළු කරන්න. $35 \times 5 \div 7 + 2$

05. සුළු කරන්න.

a. $3.6 \times 10 =$ ............................ b. $0.36 \times 10 =$ ..............................

06. විසඳන්න. $3x + 5 = 17$

07. දිග, පළල සහ උස පිළිවෙළින් 20 cm, 15 cm, 10 cm වන ඝනකාභයක හැඩය ඇති පෙට්ටියක පරිමාව කීයද?

08. කෝණමානය භාවිතයෙන් $P\hat{Q}R = 155^0$ ක් වූ කෝණය ඇඳ දක්වන්න.

09. පහත සඳහන් භාග දෙක සැසඳීම සඳහා සුදුසු සංකේතය හිස්තැනට යොදන්න.

$\frac{5}{8}$ ........... $\frac{2}{3}$

10. සෘජුකෝණාස්‍රාකාර මල් පාත්තියක් 1: 250 පරිමාණයට ඇඳ ඇත. පරිමාණ රූපයේ දැක්වෙන සෘජුකෝණාස්‍රයේ පැත්තක දිග 4 cm වේ. මල් පාත්තියේ සැබෑ දිග කීයද?




11. ශුද්ධ ටෙසලාකරණයක දැකිය හැකි ජ්‍යාමිතික හැඩතලයන් පහත ඒවායින් තෝරා ලියන්න.

සවිධි පංචාස්‍රය, සවිධි ෂඩස්‍රය, සවිධි අෂ්ටාස්‍රය, සමපාද ත්‍රිකෝණය

..........................................................................................................

12. දී ඇති කාටීසීය තලයේ P ( 2 , 3) ලක්ෂ්‍යය ලකුණු කරන්න.




13. $x = 2$ නම්, $2x^2$ හි අගය සොයන්න.

14. විසඳන්න. $(-6.75) + (+3.87)$

15. සවිධි චතුස්තලයක දැකිය හැකි මුහුණතක හැඩය ඇඳ දක්වන්න.

16. අහඹු සිදුවීමක් ලියා දක්වන්න.

17. රේඛා **දෙකක්** සමාන්තර දැයි බැලීමට කවකටු පෙට්ටියේ ඇති උපකරණවලින් ඔබට අවශ්‍ය උපකරණ දෙක මොනවාද?

18. දී ඇති සෘජුකෝණාස්‍රයේ මිනුම් අනුව එහි පරිමිතිය සඳහා ප්‍රකාශනයක් ගොඩනගන්න.




19. සීනි 25 kg 850 g ක ප්‍රමාණයක් සමාන ප්‍රමාණ වලින් පැකට් 05 කට දැමූ විට එක් පැකට්ටුවක ඇති සීනි ප්‍රමාණය කොපමණද?

20. පහත දී ඇති රූපයේ වර්ගඵලය සොයන්න.



## II කොටස

**ඕනෑම ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.**

(01) i. සුළු කරන්න .

$3+5x2-12+4$

ii. a. දී ඇති සංඛ්‍යා ඇසුරෙන් පහත වගුව පුරවන්න.

(ඔබේ පහසුවට පළමු පේළි දෙක පුරවා ඇත.)

| සංඛ්‍යාව | 1<br>2 සාධකයක් වන සංඛ්‍යා | 2<br>3 සාධකයක් වන සංඛ්‍යා | 3<br>4 සාධකයක් වන සංඛ්‍යා | 4<br>6 සාධකයක් වන සංඛ්‍යා |
|---|---|---|---|---|
| 12 | ✓ | ✓ | ✓ | ✓ |
| 15 | x | ✓ | x | x |
| 16 | | | | |
| 30 | | | | |
| 32 | | | | |
| 42 | | | | |

b. ඉහත වගුවේ 1 හා 2 තීර සහ 4 වන තීරය අතර සම්බන්ධය අනුව එළඹිය හැකි නිගමනය කුමක් ද?

(02) i. a. A = { "සුදුසු" යන වචනයේ අකුරු } නම්, A වෙන් රූපයකින් දක්වන්න.

b. දින, සෙන්ටිමීටර, මාස, ලීටර, තත්පර, අවුරුදු , ඝන සෙන්ටිමීටර යන මිනුම් ඒකක සමූහය කුලක දෙකකට වෙන් කර A හා B ලෙස නම් කරන්න.

ii. a. පරිමාව $1000\ cm^3$ වන ඝනකයක දාරයක දිග කීයද?

b. දිග 50 cm, පළල 40 cm හා පරිමාව $30\,000\ cm^3$ වන ඝනකාභයක උස සොයන්න

c ධාරිතාව 7 l 500 ml වන භාජනයකින් විශාල භාජනයකට පස් වතාවක් වතුර පුරවනු ලැබේ. විශාල භාජනයට පිරුණු වතුර ප්‍රමාණය සොයන්න.

(03) එක්තරා සමාගමක නිපදවන බිස්කට් වල $\frac{5}{12}$ ක් තිරිඟු පිටි ද , $\frac{1}{3}$ කිරි පිටි ද ඉතිරිය සීනි ද බව ප්‍රකාශ කර ඇත.

i. a. තිරිඟු පිටි හා කිරිපිටි ප්‍රමාණ වල එකතුව භාගයක් ලෙස දක්වන්න.

b. බිස්කට් වල අඩංගු සීනි ප්‍රමාණය භාගයක් ලෙස දක්වන්න.

ii. වැඩිපුර අඩංගු වන්නේ තිරිඟු පිටි ද, කිරි පිටි ද යන්න භාග සැසඳීම ඇසුරින් දක්වන්න.

iii. ඉහත බිස්කට් වර්ගයේ තිරිඟු පිටි, කිරිපිටි හා සීනි අතර අනුපාතය පිළිවෙලින් 5 : 4 : 3 නම්, 3.6 kg බර බිස්කට් ප්‍රමාණයක් නිපදවීමට අවශ්‍ය සීනි ප්‍රමාණය කොපමණ ද?

(04) i. a. 2023 වර්ෂය අයත් වන සියවස හා දශකය දක්වන්න.

b. ගුවන් යානයක් 16:30 ට කටුනායකින් පිටත් වී ටෝකියෝ ගුවන් තොටුපලට 22:45 ට ළඟා වේ. ඒ සඳහා ගතවූ කාලය කොපමණද?

ii. සෙන්ටිමීටර 24 දිග කම්බියක් සමාන කැබලි 2 කට ද සෙන්ටිමීටර 18 දිග කම්බියක් සමාන කැබලි 2 කට ද කපනු ලැබේ. ඉන්පසු ඒවායින් සෑදිය හැකි විශාලම සෘජුකෝණාස්‍රය සාදනු ලැබේ,

a. එම සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.

b. එම සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.

(05) i. දිග 6 cm හා පළල 4 cm වූ සෘජුකෝණාස්‍රයක් නිර්මාණය කරන්න.

ii. a. අරය 5 cm වූ වෘත්තයක් අඳින්න. එය මත ලක්ෂ්‍යයක් ලකුණු කර එය P ලෙස නම් කරන්න.
එම වෘත්තය පදනම් කරගෙන PQRSTU නම් ෂඩස්‍රය නිර්මාණය කරන්න.

b. ඉහත ඇඳි ෂඩස්‍රයේ P,R,T ලක්ෂ්‍ය යා කරමින් PRT $\Delta$ ලබාගන්න. එහි පාදවල දිග මැන ඒ ඇසුරින් PRT $\Delta$ කවර ත්‍රිකෝණයක් දැයි දක්වන්න.

(06) i. a.



මෙම රූපය උත්තර පත්‍රයේ පිටපත් කරගෙන සමමිතික අක්ෂය ලකුණු කරන්න.

b. වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය O ලෙසත් විෂ්කම්භයක් ඇඳ එය AB ලෙසත් නම් කරන්න.
අරයක් ඇඳ එය OR ලෙස නම් කරන්න.

ii. පසුගිය වසර තුනක පාසලක විද්‍යාව, ගණිතය හා සිංහල විෂයන් සඳහා සාමාන්‍ය පෙළ විභාගයේ දී සිසුන් ලබාගත් A සාමාර්ථ පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.




a. 2020 වසරේ A සාමාර්ථ සමානව ලැබුණු විෂයන් දෙක මොනවාද?

b. සිංහල විෂය සඳහා වැඩිම A සාමාර්ථ ගණනක් ලබාගත් වර්ෂය කුමක්ද? එම A සාමාර්ථ ගණන කීයද?

c. 2021 හා 2019 වර්ෂ වල ගණිත විෂයේ A සාමාර්ථ අතර වෙනස කීයද?

(07) i. a. පහත වීජීය ප්‍රකාශනය සුළු කරන්න.
$7a - 3b + 6b - 2a + 8$

b. අඥාතයන් සඳහා දී ඇති අගයන් අනුව පහත වීජීය ප්‍රකාශනයේ අගය සොයන්න.
$2x^2y \ (x = 3, y = 4)$

ii. සීනි 1 kg මිල x ද තිරිඟු පිටි 1kg මිල y ද නම්, සීනි 2 kg 500 g ක් සහ තිරිඟු පිටි 1kg 250 g ක් සඳහා යන මුළු වියදම වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

iii. a. පහත ලක්ෂ්‍ය සුදුසු කාටීසීය තලයක ලකුණු කර P,Q,R,S,T,P ලෙස යා කරන්න.
ලැබෙන තල රූපයේ නම ඊට යටින් ලියන්න.
P(3,1), Q(1,4) R(5,7), S(9,4) T(7,1)

b. R ලක්ෂ්‍යයේ සිට අඳින සමමිතික අක්ෂය PT පාදය හමුවන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ලියන්න.

LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න






| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**